## අ.පො.ස. (උ.පෙළ) උපකාරක සම්මන්ත්‍රණය - 2015
## සිංහල II පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|
| 1.1 | 5 |
| 1.2 | 3 |
| 1.3 | 3 |
| 1.4 | 5 |
| 1.5 | 1 |
| 1.6 | 1 |
| 1.7 | 4 |
| 1.8 | 1 |
| 1.9 | 5 |
| 1.10 | 1 |
| 1.11 | 4 |
| 1.12 | 2 |
| 1.13 | 2 |
| 1.14 | 3 |
| 1.15 | 1 |
| 1.16 | 4 |
| 1.17 | 5 |
| 1.18 | 3 |
| 1.19 | 4 |
| 1.20 | 2 |

**(ලකුණු 20 යි)**

The National e-learning Portal for The General Education

2 වන පිටුව බලන්න

2. (අ) (i) නිරිත දිග හා ඊසාන දිග මෝසම් සුළඟ පැවතීම.
කුඩා දිවයිනක් වීම, රට මැද පිහිටි මධ්‍යම කඳුකරය. (කරුණු දෙකක් ඇතත් ලකුණු දෙන්න)
(ii) තෙත් කලාපයට ලැබුණු අධික වර්ෂාව තම ජීවනෝපාය සඳහා නොගැළපුණ නිසා.
(iii) වර්ෂා ජලය එක්රැස් කර ප්‍රයෝජනයට ගැනීමට ආදි වැසියා දැක් වූ උනන්දුව නිසා.
(iv) ශ්‍රී ලංකාවට ආවේණික මනා ජල කළමනාකරණයක් පැවතීමේ හේතුවෙන්
(v) ඊසාන දිග මෝසම් සුළඟ විශාල ගොඩබිම් කලාපයක් හරහා හමා ඒම හේතුවෙන් ජල වාෂ්ප අඩු නිසා ජනිත වන වර්ෂාව ද අඩු වීම

**(ලකුණු 10)**

(ආ) * සිංහල භාෂාව පැරණි ඉන්දු ආර්ය භාෂා සම්ප්‍රදායෙන් තත්භව වූවකි.
* සිංහල භාෂාවේ වියරණ හා වාක්කෝෂයේ විකාශනයට විවිධ භාෂා සම්ප්‍රදායවල ආභාසය ලැබී ඇති අතර දෙමළ භාෂාවට ප්‍රධාන තැනක් හිමි වෙයි.
* භූගෝලීය සාධකත් ක්‍රි.පූ. 3 වන සියවසේ සිට එන ලේඛන සම්ප්‍රදායට දෙමළ භාෂාවේ ආභාසය ලැබී තිබීමත් හේතු සාධකයි.
* ක්‍රි.පූ. යුගවල සිට දෙමළ භාෂාව සිංහලයට දෙයාකාරයකින් බලපා ඇති බව විචාරකයන් පෙන්වා දී ඇත.

**(ලකුණු 15යි)**

3. රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.
* රචනය සඳහා තෝරාගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.
* ඒ කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම
* කරුණුවල පැහැදිලි බව හා නිරවද්‍යභාවය
* නිවැරදි අක්ෂර වින්‍යාසය අනුගමනය කිරීම
* ව්‍යාකරණ දෝෂ රහිත වීම
* භාෂාව ව්‍යක්ත ලෙස හැසිර වීම
* සුදුසු ලෙස ඡේද වෙන් කිරීම
* කියවිය හැකි සේ අත් අකුරු පැහැදිලි වීම
* විවිධ භාෂාත්මක අංග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකිය)

**වචන සංඛ්‍යාව අඩුවීම හෝ වැඩිවීම හෝ ලකුණු අඩුවීමට හේතුවකි.**

**(ලකුණු 25යි)**

4. (අ) (i) හෙතෙමේ ප්‍රේක්ෂකයින් පිනවමින් කරණමක් ගැසුවේය.
(ii) ත්‍රස්තවාදීන් අද පහර දෙන්නාහ'යි බලධාරිහු විශ්වාසය පළ කළහ.
(iii) ව්‍යක්ත කවීකයකු ගොවිජන රූස්වීමේ කතා කරනු ඇත.
(iv) නිවැරදි වාක්‍යයකි.
(v) ඔවුහු ක්‍රීඩකයන් මෙන් ම නළුවෝ ද වූහ.

**(ලකුණු 10යි)**

(ආ) (i) රජය විසින් නව ඖෂධ ප්‍රතිපත්තියක් සම්මත කර ගැනෙයි./ගැනේ./ගනු ලබයි./ගනු ලැබෙයි.
(ii) රංග භූමියට පිවිසි ශිල්පීන් විසින් ස්වකීය රංගනයෙන් ප්‍රේක්ෂකයෝ කුල්මත් කෙරෙති./කෙරෙත්./කරනු ලබති./ලබත්/කරනු ලැබෙති./ලැබෙත්
(iii) මෙවර රාජ්‍ය සම්මාන සාහිත්‍ය උත්සවයේ දී කෙටි කතා පිළිබඳ ප්‍රථම ත්‍යාගය මා විසින් ලබා ගැනිණි./ගැනිණ./ගන්නා ලදි./ගනු ලැබුවේය./ගනු ලැබීය.
(iv) කාව්‍යය, අලංකාරවලින් පමණක් සැරසිය යුතුය යන මතය ඇතැම් විචාරකයන් විසින් ප්‍රතික්ෂේප කෙරිණි./කරන ලදි./කරනු ලැබුවේය./කරනු ලැබීය.
(v) ගුවන් යානා පැදවීම සඳහා දීර්ඝකාලීන පරිචයක් අවශ්‍ය බව විද්‍යාඥයන් විසින් ප්‍රකාශ කෙරෙයි./කෙරේ./කරනු ලබයි./කරනු ලැබෙයි.

**(ලකුණු 05යි)**

3 වන පිටුව බලන්න

(ඉ) (i) නිෂ්පාදකයකු
(ii) අසන්නෝ
(iii) විද්‍යමාන වේ.
(iv) උගතුන්
(v) හස්තීන්

**(ලකුණු 05යි)**

5\. (අ) (i) අත්තුක්කංසනයෙන් - තමා උසස් කොට දැක්වීමෙන්
(ii) ස්වයංවාරණයකින් - තමන් විසින් ම තහනමක් දමා ගැනීම.
තමන් විසින් ම පාලනයක් යොදා ගැනීම.
(iii) නිශ්ශරණාධ්‍යාශයෙන් - කිසිදු ලාභාපේක්ෂාවක් නොමැතිව
යමක් බලාපොරොත්තු නොවී

**(ලකුණු 03යි)**

(ආ) (i) කිසිවකට උපමා කළ නොහැකි - අනූපමේය
(ii) පහතින් ලියන ලද - අධෝලිපි
(iii) කිසියම් දෙයක ස්වභාවය ගැන තීරණය කළ නොහැකි - අවිනිශ්චිත

**(ලකුණු 03යි)**

(ඉ) (i) ප්‍රතිපෝෂණය
(ii) ප්‍රතිපාදන
(iii) වෛකල්පික
(iv) දීපව්‍යාප්ත
(v) ප්‍රතිපක්ෂ
(vi) අනන්‍ය

**(ලකුණු 03යි)**

(ඊ) (i) ඉසි - ඉසීම (ක්‍රියා)/සෘෂිවරයා/ඊර්ෂ්‍යාව/කැමති
(ii) තිර - තිරය/ස්ථිර
(iii) වන - වැනි (නිපාත)/කැලය/විරහය/වන්නාවූ (ක්‍රියා)
(iv) නිය - නියපොතු/නීතිය/ඥාණය
(v) තුරු - නිපාතාර්ථය/තරු/ගස්
(vi) හෙන - විශාල/වැටෙන (ක්‍රියා)/අසනි

The National e-learning Portal for The General Education

**(ලකුණු 06යි)**

6\. (අ) (i) මිශ්‍ර ක්‍රියා, (විශේෂණ) සමාස, (ආධාර) විභක්ති
(ii) සන්ධි/තද්ධිත/උපසර්ග නාම, තද්ධිත, නිපාත
(iii) තද්ධිත, නිපාත,(අව්‍ය) සමාස
(iv) (විශේෂණ) සමාස, (අතීත) කෘදන්ත, ක්‍රියා විශේෂණ
(v) උපසර්ග, කෘදන්ත, (දකාරාර්ථ) සමාස

**(ලකුණු 15යි)**

7\. (අ) (i) ඌරන් කැකුණ තළන විට හබන් කුකුළන්ට මගුල්
(ii) ඕනෑකමට කබරගොයාත් තලගොයා වීම.
(iii) කටින් බතල කොළ සිටුවීම.
(iv) පය බරවායට පිටිකර බෙහෙත් බැඳීම.
(v) පරිස්සමට තිබූ දෙය ඇලියාවට යාම.
(vi) කණ කොකාගේ සුදු පෙනෙන්නේ ඌ ඉගිලුණාම.

**(ලකුණු 03යි)**

4 වන පිටුව බලන්න

(ආ) (i) බාධා කිරීම/අකුල් හෙළීම
(ii) බොරුවට හැඬීම/ව්‍යාජ ලෙස කඳුළු සැලීම
(iii) වාසියට යොදා ගැනීම
(iv) පැත්තකට/ඉවතට දැමීම/කල් දැමීම (ප්‍රයෝජනයට නො ගෙන)
(v) රහසේම පිටව යාම
(vi) අවසන් උත්සාහයත් දැරීම **(ලකුණු 03යි)**

(ඉ) (i) සමානාර්ථ පද දෙකකි.
(ii) සමානාර්ථ පද දෙකකි.
(iii) විරුද්ධාර්ථ පද දෙකකි.
(iv) සමානාර්ථ පද දෙකකි.
(v) සමානාර්ථ පද දෙකකි.
(vi) අර්ථ රහිත පද දෙකකි. **(ලකුණු 03යි)**

(ඊ) (i) යනවා
(ii) සමූහය
(iii) මාස් කන්නය
(iv) කෙසෙල් මුව
(v) අහංකාරය/ආඩම්බරය
(vi) කැලෑ බද ගම්මානය **(ලකුණු 03යි)**

(උ) (i) කමතෙහි වී මනින්නා
(ii) මැණික් ගැරීමෙන් පසු වට්ටිය පතුලේ ඉතිරිවන කොටස්
(iii) කුඹුරේ පළමු වතුර බැඳීම
(iv) මාදැලේ මාළු රොක්වන තැන
(v) රුවල බඳින කඹය
(vi) දෝනා සවිකරන පුවක් පටි **(ලකුණු 03යි)**

**(ලකුණු 3 x 5 = 15යි)**

8. (අ) (i) කල්පනාකාරි සාමාන්‍ය මිනිසුන් තුළ හටගන්නා මේ හැඟීම්වලට හාත්පසින් වෙනස් වූ ස්වභාවයක් නවීන විද්‍යාවෙන් දැක්වෙන්නේ ය. පැන්සිලීන් ද ගෙන්දගම් මිශ්‍ර ඖෂධයන් ද රෝග සුව කිරීමේ අංශයෙහි විප්ලවයක් ඇති කර තිබේ. කෝටි සංඛ්‍යාත මනුෂ්‍යයන් විනාශ කරමින් පැවතුණ බිහිසුණු රෝග නවීන විද්‍යාත්මක ඖෂධවලින් දැන් පරාජය කෙරෙන්නේ ය. වේගවත් ගගනයාත්‍රාවන්ගෙන් දුරකතර නැති කෙරෙන්නේ ය. විදුලි බලයෙන් විස්මයජනක සැප පහසුකම් මනුෂ්‍යයන්ට අත් කර දෙන්නේ ය. මිනිසුන්ට උවමනා සෑම දෙයක්ම ක්ෂණයකින් නිෂ්පාදනය කිරීමට බලය ඇති කර්මාන්තාගාර ඇති වන්නේ ය. උණ සන්නිපාතය, මසූරිකාව, කොලරාව ආදී බිහිසුණු වසංගත රෝග ශිෂ්ට සමාජයෙන් අතුරුදහන් වන්නේ ය. ශ්‍රී සමෘද්ධියක් සහිත අනාගතයකට මනුෂ්‍ය වර්ගයා ළං වෙමින් සිටින බව බොහෝ දෙන විශ්වාස කරති. එහෙත් මේ සමෘධිමත් අනාගතයේ සැප සම්පත් භුක්ති විඳීමට මනුෂ්‍ය වර්ගයා ඉතිරි වෙති'යි කාට නම් කිව හැකි ද? පරමාණු බෝම්බයත් ඊටත් වඩා විනාශදායක ආයුධත් ඒ ඒ බල සම්පන්න රටවල ආණ්ඩුවල මෙහෙයවීමෙන් ම නිර්මාණය වෙමින් පවතින්නේ ය.
(ii) මිශ්‍ර, යාත්‍රා
(iii) දීර්ඝ පාපිල්ල, කෙටි ඉස්පිල්ල, ඇලපිල්ල
(iv) සමෘද්ධිමත්,
ඖෂධයන්
(v) ලංකාව, රංගශාලාව, උත්තුංග
සෞඛ්‍ය, විද්‍යුතය, නෘත්‍ය **(ලකුණු 15යි)**

| | | |
|---|---|---|
| **පද බෙදීම** | **ලකුණු** | **04** |
| **විරාම ලක්ෂණ** | **ලකුණු** | **03** |
| | | **07** |

**II - v දක්වා ලකුණු 02 බැගින්**
**ලකුණු 08**

5 වන පිටුව බලන්න

1. (අ) (i) මසුරු සිටාණන්ගේ සැදැත් නොනසා සම්පතටත් හානි නොකොට ඇසිල්ලකින් උන් පහදවා ගෙන පාත්‍රයට පිළිගෙන ගෙනෙන්නට හැකි කබලු උන් ලවා ම ගෙන්වා ගෙන බුදුන්ට සමීප කරවා සෝවාන් කරවීම.

(ii) මල් රොන් ගන්නා මී මැසි බඹර මැසි ආදීන් මලෙහි පැහැයට හා සුවඳට හානි නොකොට රොන් ගෙන මී රස කිරීමට ගස් බෙණවල මල්රොන් හා වෙනත් අවශ්‍ය දේවල් දමා මී බැඳ මී රස කරන්නා සේ.

(iii) තම අනුගාමිකයන්ගේ/ශිෂ්‍ය හිමිවරුන්ගේ දක්ෂතා සෙසු අය ඉදිරියේ ඇගයීමට ලක් කිරීම.

(iv) සම්බන්ධ විභක්තිය **(ලකුණු 04)**

(ආ) (i) දෙන ලද පිළි සිවුරක් ලෙස සකස් කොට ඇඳීම හෝ පෙරවීම නොකරන බවත් ආරක්ෂා කොට තැබීමක් හෝ වෙනත් තැනකට දීමක් නොකරන බවත් දැක මෙසේ වීමට හේතුව කුමක් ද යන්න පරීක්ෂා කිරීමට

(ii) අතින් පයින් තලා දුර්වල කොට අමු සොහොනකට ඇදගෙන ගොස් අලුත් මළ මිනිසකු හිස යටට සිටින සේ මුනින් හරවා ඔහු පිට සොරා උඩුකුරු කොට තබා දැත දෙපය පිට ඉස ආදී තැන් ලෙහා ගත නොහැකි වන සේ තදින් බැඳ දැමීම.

(iii) සොරාට ගම්මුන්ගෙන් ලැබිය හැකි සියලු උපකාර වළක්වා ලීම.

(iv) දිග හිස කෙස් වැටිය තදින් අල්ලා ගෙන **(ලකුණු 04)**

(ඉ) (i) රජ බිය සහ සොර බිය යන දෙක
(ii) රාජ සේවකයින් විසින් පළමුව පිසූ ආහාර පැහැර ගැනීම නිසා
(iii) ගොනාට අස්ථානයේ පහර ගැසීම
(iv) කැමැත්තක් නොමැති ව/අපේක්ෂාවක් හෝ ආශාවක් නැතිව
ඇනුම් පද කීම, බැනීම සහ නින්දා කිරීම **(ලකුණු 04)**

(ඊ) (i) ගන අඳුර දුරු කිරීම සඳහා
(ii) මුහුද නමැති මන්දිරයට ඇතුළු වීම/වැදීම/බැසීම
(iii) මෙහි කඳවුර නම් ගසේ නිල් පැහැති කොළයි. කඳ මහවීදිය. මීමැසි සමූහයා කඳවුරේ හැසිරෙන පිරිසයි.
(iv) රූපකාලංකාරය **(ලකුණු 04)**

(උ) (i) පන්සිය පනස් ජාතක පොතේ සම්බුලා ජාතකයෙන් උපුටාගත් පාඨයකි. සොත්ථිසේන රජුගේ නොසලකා හැරීමෙන් දුකට පත්ව සපත්නිරෝෂයෙන් පෙළුණු සම්බුලා දේවිය පිළිබඳ ව පිය රජුගේ අවවාද ඇසීමෙන් පසු සම්බුලාව තමා සමීපයට කැඳවූ සොත්ථිසේන රජු ඇය අමතා කළ ප්‍රකාශයකි.

(ii) ඩබ්ලියු.ඒ. සිල්වා සූරීන්ගේ පුරුද්ද කෙටි කතාවෙන් උපුටා ගත් පාඨයකි. වලෙන්ති වෙදා රෝගී තරුණිය පරීක්ෂා කරමින් සිටිය දී ඇසූ පැනයකට තරුණිය දුන් පිළිතුරකි.

(iii) සද්ධර්මරත්නාවලියේ මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුවේ එන පාඨයකි. සිටුවරයා කබලු කෑමේ ආශාවෙන් පෙළෙමින් සිටින බව දැනගත් දේවිය අඹුදරුවන්ටත් සෑහෙන ලෙස කැවුම් පිසින්නට දැයි ඇසූ අවස්ථාවේ සිටුවරයා දුන් පිළිතුරකි.

(iv) සද්ධර්මාලංකාරයේ සාලිරාජ වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. රාජකුමාරයාගේ කුසලානුභාවයෙන් දෙවියන් හා මනුෂ්‍යයින් අනේක ප්‍රකාර පඬුරු ගෙනා අවස්ථාවේ අශෝකමාලාවගේ කුසලයක් නුදුටු බව සාලිරාජ කුමරු පැවසූ විට ගෙයි වසන දේවතා දුව ගෙනා බෙහෙත් කැඳිත්ත දැක රජු සිනාසුණු අවස්ථාවේ අශෝකමාලාව සාලිරාජ කුමරු අමතා කළ ප්‍රකාශයකි.

(v) මළගිය ඇත්තෝ නවකථාවෙන් උපුටාගත්තකි. දෙවෙන්දොරාසං කබුකි බලා අවසානයේ ෂිම්බෂිවල පිහිටි "යේ ලයි ෂයැං" කෝපිහලට නොරිකො කැටුව ගියේය. එය ඉහළ පෙළේ තැනක් බැවින් නොරිකො දෙවෙන්දොරාසං අමතා කළ ප්‍රකාශයකි.

(vi) රත්නාවලි නාට්‍යයෙන් උපුටාගත් පාඨයකි. වසුභූති හා බාභ්‍රව්‍ය දෙදෙනා උදයන රජු මුණගැසීමට ආ අවස්ථාවේ රජු සිංහල රජතුමාගේ සුවදුක් විමසූ විට වසුභූති දුන් පිළිතුරකි.

**(ලකුණු 08)**

The National e-learning Portal for The General Education

(ඌ) සුරා සොඬ සැමියකු තම මියගිය බිරිඳ පිළිබඳ අතීතාවර්ජනයක යෙදී කෙරෙන ව්‍යාජ ගුණ කථනයක ස්වරූපය ගන්නා මෙම පැදි පෙළ කුටුම්බ ජීවිතයේ අශුභ පක්ෂය විවරණය කරන්නකි. දරුණු සමාජ ව්‍යසනයක් වන මත් උවදුර සහ ඒ තුළින් පැන නගින අතුරු ව්‍යසනයන්ගේ ගොදුරක් බවට පත් වන කාන්තාවට අත්වන ඉරණම මේ තුළින් ගම්‍ය කෙරේ. කාන්තාවක සතු විවිධ ගුණ සුරාසොඬ සැමියෙකුගේ දුර්ගුණ තුළින් මතු කිරීම මෙහි දී දක්නට ලැබේ. යසවතී, සිරිමතී, පතිවතී, රසවතී, කුසුමාවි, නයනාවි, සීදේවි, දේවි යන නම් ඒ ගුණ පිළිබිඹු කරන සංකේතයන් සේ ගිනිය හැකිය.

තේමාව කුළු ගැන්වීම සඳහා යොදා ගන්නා දෘෂ්ටිකෝණය නව්‍ය වන අතර සැමියාගේ වැලපීම වෙනුවෙන් යොදා ගන්නා බස්වහර ද උපහාසාත්මක ස්වරූපයක් ගෙන තිබීම විශේෂත්වයකි. බිරිඳ මිය යාමෙන් පසු ඇය ජීවත්ව සිටිය දී මුහුණ පෑ ඛේදනීය අත්දැකීම් එකින් එක විදහා දැක්වීමත් එමගින් සැමියාගේ මානසික ආතතිය නිරූපණය කිරීමත් මේ කවි පෙළේ පෙනෙන විශේෂත්වයකි. මෙහි යොදා ඇති විරිත ද ප්‍රස්තුත කරුණු විශද කිරීමට ඉවහල් වේ.

2. කුතුහලය දැනවීමට උත්සාහ කරමින් වස්තු විකාශය කරයි. එහිදී ගැමි බස හා උපමා භාවිතයට ගැනීමත් චරිත කෙරෙහි උපහාසාත්මකව වුවත් සදය හැඟීමෙන් යුක්තව බැලීමත් ධර්ම උපදේශ ඉදිරිපත් කිරීමත් දක්නට ලැබේ.

මේ කරුණු පැහැදිලි වන ආකාරයට කථා දෙකක් ඇසුරෙන් විස්තර දක්වා ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු දෙන්න.

**පටාචාර වහන්දැගේ වස්තුව**

* පටාචාරා මෙහෙකරු සමග නිවසින් පැන යාම
* ඔහු සමග ගත කළ දුක්ඛිත ජීවිතය
* අවසානයේ දරුවන් අහිමි වීම, දෙමව්පියන්ගේ අභාවය නිසා ඇතිවන කැලඹීම
* බුදුරජුන් හමුවේ යථා තත්වය තේරුම් ගැනීම

**මච්ඡරිය කෝසිය සිටාණන්ගේ වස්තුව**

* කබලු කෑමට ඇති ආශාව
* ඒ නිසා අසනීප තත්ත්වයට පත් වීම
* ඒවා පිළියෙල කර ගැනීමට බිසව යොදා ගන්නා ආකාරය
* උත්සන්න වූ ලෝභය මුගලන් මහ රහතන් වහන්සේගේ පැමිණීමෙන් හීන වී යන අයුරු
* අවසානයේ නිර්ලෝභී අයෙකු බවට පත්වීම

යන කරුණු මතුවන අයුරින් යෝග්‍ය බස් වහරක් යොදා ගෙන උපදේශාත්මකව ලියා ඇත්නම් උපරිම ලකුණු ලබාදෙන්න. **(ලකුණු 15)**

**නැතහොත්**

මෙහිදී ඡද්දන්ත ජාතකය හා ගණ්ඩ තීන්දු ජාතකය වැදගත් වේ. ඡද්දන්ත ජාතකයේ දී බිසව හැසිරෙන ආකාරය නිසා වැද්දා දුෂ්කර ගමනක් ගෙවා දළ කැපීමට ඉදිරිපත් වේ. ඒ සඳහා වැය කරන මුදල් ප්‍රමාණය ද අධිකය.

ගණ්ඩ තීන්දු ජාතකයේ දී රජුගේ අදූරදර්ශී චර්යාවන් නිසා රාජ්‍ය නිලධාරින් කරන වංචා දූෂණ හා නොපනත්කම් මගින් රටවැසියෝ මහත් සේ පීඩාවට පත් වෙති.

යටත් පිරිසෙයින් මේ කථා දෙක ආශ්‍රයෙන් ප්‍රමාණවත්ව කරුණු දක්වා තිබීම සාර්ථක පිළිතුරක් සඳහා අවශ්‍ය වේ. එවැනි පිළිතුරු සඳහා උපරිම ලකුණු ලබා දෙන්න. **(ලකුණු 15)**

3. * මෙහිදී බොහෝ කරුණු අභය ස්ථවිර චරිතයෙහි දක්නට ලැබේ. මේ තෙරුන්ගේ සිවුරු පිරිකර සොරකම් කළ සොරු දෙස උන්වහන්සේ බැලුවේ උපේක්ෂා සහගතවය. තම දායකයාගේ දඬුවමට පාත්‍ර වූ පසුව පවා සොරාට පිහිට වෙමින් යහමග පෙන්වා දුන්නේ මෙම තෙරුන් වහන්සේ ය.

* සාලිරාජ කථාවේ සාලිය හා අශෝකමාලාගේ විවාහය නිසා දුටුගැමුණු රජුටත් ඇමතියන්ටත් සිදුවූයේ මහත් අර්බුදයකට මුහුණ පෑමටය. ඔවුන් දෙදෙනාගේ විවාහය අසම්මත වූවක් ලෙස සමාජය විසින් සැලකේ. එහෙත් රජු හා ඇමතියන් මේ දෙදෙනාට දඬුවම් කිරීමට හෝ අපහාස කිරීමට ගියේ නැත. ඒ දෙදෙනා රැකබලා ගනිමින් යහමගට ගැනීමට උත්සාහ ගත් බව පෙනේ. සාලියට රටේ රජකම අහිමි වීම සමාජ සම්මතයත් රාජනීති ධර්මයත් අනුව සිදුවූවක් බව පෙනේ. මෙහි දී රජුට මැදිහත් වීමෙන් යමක් කළ නො හැකි වේ. මේ කථා වස්තු දෙකෙන් කරුණු දක්වා සාකච්ඡා කර ඇත්නම් යෝග්‍ය පරිදි ලකුණු ප්‍රදානය කරන්න.

**(ලකුණු 15)**

7 වන පිටුව බලන්න

4. ගිරා සංදේශයේ ඇතුළත් අම්බලමේ කතා, දියකෙළි හා වන වර්ණනා ආශ්‍රය කොට ගෙන කරුණු දැක්වීම අවශ්‍ය වේ. වර්ණනාවලට යෝග්‍ය ආකාරයෙන් කාව්‍යාකෘති යොදා තිබීම මෙහිදී විමසීමට ලක්කළ යුතුය.

**අම්බලමේ කතා**

* කවියා රජු ගැන වර්ණනයට කෙළින් ම මැදිහත් නොවී අම්බලමට පැමිණෙන ආගන්තුකයන්ගේ මාර්ගයෙන් රජුගේ තේජස, කීර්තිය, යුද්ධ දක්ෂතාව, පරිත්‍යාගය, ආගමික භක්තිය ආදී කරුණු ඉදිරිපත් කිරීම.

* පොදු ජනතාවට යෝග්‍ය බස්වහරක් ආකෘතියක් යොදා ගැනීම සිද්ධි මනා ලෙස ගැළපීම.

**දිය කෙළි වැනුම**

* කාන්තාවන් දිය කෙළියට සැරසුණු ආකාරය, වතුරට පනින ආකාරය, වතුරේ හැසිරෙන ආකාරය, ඔවුන්ගේ කෙළි කවට බස් ආදියක් රසවත් ව නිරූපණය කිරීම හා එයට ගැළපෙන ආකාරයට ආකෘතියක් යොදා ගැනීම.

* මෙහි දී දිය කෙළි නැරඹීමට පැමිණි මිනිසුන්ගේ ක්‍රියා කලාපයන් ද නිරූපණය කෙරේ.

* මෙම වැනුම අතරින් මතුවන්නේ දිය කෙළින කතුන්ගේ ජංගම ස්වරූපයකි.

**වන වැනුම**

* විවිධ සතුන්ගේ චර්යාවන් මතු කරමින් වින්දනයක් ලබන කතුවරයා ඔවුන්ගේ ස්වරූපය පාඨක සිත් තුළ ඇඳී යන ආකාරයේ ආකෘතියක් තෝරා ගෙන ඇත.

* සතුන්ගේ ක්‍රියාකාරකම් සජීවී ආකාරයෙන් මෙහි දී ඉදිරිපත් කෙරේ.

* මෙම වර්ණනා තුනේදී ම යෝග්‍ය උපමා, රූපක ආදිය භාවිත කරමින් පාඨක සිත්සතන් වර්ණනා තුළින් නිරූපිත එම වස්තු වෙතට යොමු කෙරේ.

සාර්ථක පිළිතුරක මෙම කරුණු ඇතුළත් ව තිබිය යුතුය.

**(ලකුණු 15)**

5. නොරිකො සං අපේක්ෂා කරන්නේ දෙවෙන්දොරාසං සමග යහළු වී විවාහ ප්‍රාප්තව අනාගතයේ සාර්ථක පවුල් ජීවිතයක් ගත කිරීමටයි. ඇගේ මෙම අරමුණ විවිධ අවස්ථාවල දී ඉදිරිපත් කළත් දෙවොන්දොරාසංගෙන් යහපත් ප්‍රතිචාර නොලැබේ. ඔහු නිතර ම ඇය පිළිබඳ ව සිතන්නේ මනෝ ලෝකයක අතරමං වූවෙකුගේ ආකාරයෙනි. ජීවිතය පිළිබඳ ඔහු සතුව තිබූ අල්ප අත්දැකීම්හි ස්වභාවය මෙයින් පැහැදිලි වේ. එසේම විවාහ ජීවිතයේ ගැටලුවලට මුහුණ දීමට හෝ ක්‍රියා කිරීමේ අධිෂ්ඨානයක් හෝ ධෛර්යයක් හෝ ඔහු තුළ නොමැති බව පෙනේ. **(ලකුණු 15)**

6. යටත් පිරිසෙයින් කෙටිකතා දෙකක්වත් තෝරා ගෙන සිද්ධි ගැළපීම, රස නිෂ්පත්තිය හා චරිත නිරූපණය අතින් කෙටි කතාකරුවා දක්වා ඇති දක්ෂතා පැහැදිලි කිරීම මෙහිදී අපේක්ෂිතය.
මුදියන්සෙ මාමා, මාවතේ දරුවෝ, තාත්තාගේ මළගම, සාක්කි තුනක්, සත් ගුණවත් සාමෙල්, පුතාගේ ශිෂ්‍යත්වය, කොළඹ ගමන ආදී කෙටි කතාවලින් නිදසුන් සපයමින් පිළිතුරු ලියා තිබිය යුතුය.

* එක් අංශයකට කරුණු තුනක්වත් ඇතුළත් වනසේ විස්තර කිරීම අවශ්‍යය.

**(ලකුණු 15)**

7. සමාජ සංසිද්ධි ඇසුරෙන් ජනිත වූ පුද්ගල අනුභූතීන් දැක්වීමේ දී මධ්‍යස්ථ දෘෂ්ටි කෝණයකින් හෝ පක්ෂපාතීව හෝ වර්ණනා කිරීම කවි පන්තිවල දක්නට ලැබේ. මේ දෙඅංශය ගැන ම සැලකිලිමත්වෙමින් ඉදිරිපත් කෙරෙන පිළිතුරු ගැන විශේෂ අවධානයක් යොමු විය යුතුය.

මධ්‍යස්ථ දෘෂ්ටි කෝණයෙන් මතු වන නිර්මාණ
දෙදෙනාම දියණියෝ, මිතුරන් දෙදෙනා සහ පොරොව, එතෙර ගිය පොඩි දුවට, වංක ගිරියට මාරුවීම, වලව්වට වැසි අවුත්, ලීස්තර වැට යන නිර්මාණවලින් තුනක්වත් ගෙන මධ්‍යස්ථ දෘෂ්ටි කෝණයෙන් ඉදිරිපත් කොට ඇති ආකාරය විමසිය යුතුය.

8 වන පිටුව බලන්න

මධ්‍යස්ථ දෘෂ්ටි කෝණයෙන් බැහැරව පක්ෂපාති දෘෂ්ටි කෝණය ගැන අවධානය යොමු කර ඇත්නම් එබඳු පිළිතුරු ද විමසිල්ලට ගත යුතුය.

පක්ෂපාති දෘෂ්ටි කෝණයකින් කරුණු දැක්වීම.

හිඟන්නා, දිවා භෝජනය, පරලොවට පණිවිඩයක්, වවුල් හමුව යන කවි පන්තිවල දී සමාජයේ අශුභ පක්ෂය ගැන ම පක්ෂපාති ලෙසින් කරුණු දැක්වීම පෙනේ.

08. රත්නාවලි කතුවරයා හාස්‍යෝත්පාදක සිදුවීම් පමණක් නො ව මානුෂික හැඟීම් ද මනාව නිරූපණය කරන අවස්ථා විමර්ශනය කිරීම මෙහි දී අපේක්ෂිතයි.

01. හාස්‍යෝත්පාදක සිදුවීම්
   * විදූෂකගේ චරිතය සෑම අවස්ථාවක දී ම හාස්‍යය මතු කරයි.
   * රජු හා විදූෂක සැළලිහිණියා දැක පවත්වන සංවාදය
   * වෙස් වලා පැමිණි බිසව දුටු රජතුමා ඇය සාගරිකා යැයි රැවටීම

02. මානුෂික හැඟීම් මනාව නිරූපණය වන අවස්ථා
   * රජුගේ ස්ත්‍රී ලෝලත්වය, ඔහු තම බිසවට ආදරය කළත් සාගරිකා වැනි රූමත් ළඳුන් දෙස ද ඇදී ගිය ආකාරය කතුවරයා නිරූපණය කිරීම.
   * සේවිකාවන්, කුමාරිකාවන්, අග බිසව හා රජු අතර ඇතැම් අවස්ථාවල දී ඇතිවන යම් යම් සිදුවීම් නිසා ආවේගශීලී ස්වභාවයන් මතුවීම.
   * ඇතැම් විට ලජ්ජාව, කෝපය, ශෝකය නො ඉවසීම
   * සපත්නිරෝෂය මතුවීම
   * රජතුමා ආලයෙන් වෙළීම
   * අශුභජනක, දුක්ඛදායක ආරංචි නිසා පුද්ගලයින් විලාප දෙන ආකාරය
   * රජු කලබල වීම (සාගරිකා දම් වැලෙන් බැඳ පුච්චනවා යයි කී අවස්ථාව)

චරිත දෙකක් ඇසුරු කරගෙන මේ කරුණු ඉදිරිපත් කර ඇත්නම් ප්‍රමාණවත් වේ.

The National e-learning Portal for The General Education